ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

**ඉන්දියාවේ ඕ නාගා ගායනා කණ්ඩායම කොළඹදී ප්‍රසංගයක් ඉදිරිපත් කරයි**

ඉන්දියාවේ ඕ නාගා ගායනා කණ්ඩායම ඉන්දුනිසියාවේ Fricilia මිශ්‍ර ගායන කණ්ඩායම සහ ශ්‍රී ලංකාවේ රජයේ බාලිකා පාසල් ගායනා කණ්ඩායම වන විශාඛා විද්‍යාලයීය ගායනා කණ්ඩායම සමගින් ත්‍රෛ ජාතික "සාමයේ ප්‍රසංගය" සඳහා ඊයේ පස්වරුවේ සහභාගී විය. රොහාන් ඩී. ලැනරෝල් මහතා විසින් මෙහෙයවන ලද මෙම ප්‍රසංගය ලයනල් වෙන්ඩ්ට්හිදි පැවැත්විණ.

ඊසානදිග ඉන්දියාවේ නාගලන්තයේ ජීවත් වන ඕ නාගා සහ වෙනත් ගෝත්‍රික කණ්ඩායම්වල සාමාජිකයන්ගෙන් සැදුම්ලත් මෙම ගායනා කණ්ඩායම විවිධ ජාත්‍යන්තර අවස්ථාවන් සඳහා සහභාගී වී ඇති අතර කලාකාමී සහ සමාජ දායකත්වයේ විශිෂ්ඨත්වය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිරිනමන "Angel of Peace Award"සම්මානයෙන්ද පිදුම් ලබා ඇත.

ඉන්දියාවේ ඊසාන දිග කෙළවරෙහි පිහිටා ඇති නාගලන්තය ඉතිහාසය , සංස්කෘතිය සහ විවිධත්වය කැටි කරගත් අපූරු තෝතැන්නකි. මෙම ප්‍රාන්තයේ තමන්ටම අනන්‍ය වූ සංස්කෘතික පද්ධතීන් සහිත විවිධ ගෝත්‍ර 16 ක් පමණ ජීවත් වේ. එක් එක් ගෝත්‍රයන් අනුගමනය කරනු ලබන සම්ප්‍රදායන් විවිධ ආත්ම, සාඵල්‍යතාවය, සුවිශේෂී බැඳීම් සහ පාරිශුද්ධකරණය වැනි දේ කේන්ද්‍ර කරගත් සැමරුම් වර්ෂයක් බවට පරිවර්තනය වේ . පිරිසර ජන ජීවිතය හා සබැඳි මෙම විචිත්‍රවත් සාම්ප්‍රදායික අවස්ථාවන් සංචාරකයින් විශාල වශයෙන් ඉන්දියාවේ මෙම කඳුකර ප්‍රාන්තය වෙත ආකර්ෂණය කරනු ලබයි.

දේශීය බම්බු යොදාගෙන නිර්මාණාත්මකව සිදු කරනු ලබන සාම්ප්‍රදායික ගෘහ නිර්මාණ ශිල්පය සඳහාද මෙම ප්‍රාන්තය නම් දරා ඇත. මෙම ප්‍රාන්තය ඉතාමත් ප්‍රසිද්ධ තවත් දෙයක් වන්නේ ලෝකයේ වඩාත්ම සැර මිරිස් වර්ගයක් වන හුත් ජොලෝකියා නමැති මිරිස් වර්ගය සඳහාය.

ලොව පුරා සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගත් Hornbill උත්සවයද නාගලන්තයේ ජනප්‍රියතාවය මැතක සිට ඉහළ නංවා ඇත. මෙම උත්සවය දෙසැම්බර් මාසයේ පළමු සතියේදී පැවැත්වෙන අතර , එහිදී කොහිමා දිස්ත්‍රික්කයේ කිසාමා ගම්මානයේදී මුළු නාගා සංස්කෘතියම ඉතා විචිත්‍රවත් ලෙස විදහා දක්වයි. නාගලන්ත ප්‍රාන්ත රජය විසින් සංවිධානය කරනු ලබන මෙම උත්සවයට නාගලන්තයේ සියලුම ප්‍රධාන ගෝත්‍රයන් සහභාගී වේ . මෙම උත්සවය සාම්ප්‍රදායික කලාවන්, නර්තනයන්, ජන ගී සහ ක්‍රීඩා වලින් සමන්විත වේ. මෙම සියල්ල සිදු වන්නේ දැව කැටයම් සහ ගෝත්‍රික කුඩාරම් ආදියෙන්ද දවස අවසානයේදී වැයෙන සාම්ප්‍රදායික බෙර ආදියෙන්ද සමන්විත අත්‍යාලංකාර දර්ශනයන් මධ්‍යයයේය.

උත්සවයන්ගෙත් උත්සවය ලෙස හඳුන්වනු ලබන Hornbill උත්සවය සතියක් මුළුල්ලේ පැවැත්වෙනු ලබන සංස්කෘතික ඉදිරිපත් කිරීම් , ජන ක්‍රීඩා, අත්කම් නිර්මාණ, සංගීත ප්‍රසංග, විලාසිතා, බයිසිකල් පැදීම , මෝටර් ක්‍රීඩා , සිනමා දර්ශනයන් සහ විවිධ තරග වලින් අලංකාර වේ.

නාගලන්තය කුතුහලය දනවන අතිශය සුන්දර ප්‍රාන්තයක් වන අතර ඕ නාගා ගායන කණ්ඩායම සිය ඉදිරිපත් කිරීම මගින් එම ප්‍රාන්තයේ වෙසෙන ජනයාගේ විවිධ දක්ෂතා පිළිබඳ යම් අදහසක් ලබා දීමට සමත් විය.

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ කොළඹ පිහිටි ඉන්දුනීසියානු තානාපති කාර්යාලය මෙම ප්‍රසංගය සඳහා දායකත්වය ලබා දී තිබිණ.

*****

2019 නොවැම්බර් 1